| මතුගම අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන | | |
| 9 ශ්‍රේණිය | ස්වභාවික සම්පත් තිරසරව භාවිතය | ඒකකය - 19 |

☆ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්නී

1) ඛනිජයක් ලෙස සැලකිය නොහැක්කේ පහත සඳහන් ඒවායින් කවරක්ද?

1. සිලිකා වැලි 2.මිනිරන් 3. ඇපටයිට් 4. ග්‍රැනයිට්

2) ශ්‍රී ලංකාවේ ජාතික මාණික්‍යය ලෙස නම් කර ඇති මාණික්‍යය වන්නේ,

1. වෛරෝඩි 2. පුෂ්පරාග 3. නීල මාණික්‍යය 4. තෝරමල්ලි

3) මැණික්වල වැදගත් ලක්ෂණයක් නොවන්නේ පහත ඒවායින් කුමක්ද?

1. ඉහල වර්තනාංකය 2. වර්ණය 3. තන්‍යතාවය 4. දැඩිබව

4) "මෝ" පරිමාණයට අනුව දෘඪතාවය අඩුම ඛනිජය ලෙස සැලකෙන්නේ,

1. දියමන්ති 2. ටැල්ක් 3. ක්වාට්ස් 4. ජිප්සම්

5) ජලය තුලදී කල් පවතින නිසා "දිය යට කෙරෙන කාර්යයන් සඳහා" භාවිතා කරන දැව වර්ගයක් වන්නේ,

1. හොර 2. රුක්අත්තන 3. ලුණුමිදෙල්ල 4. පානක්කා

6) දැව දිරාපත් වීම සඳහා බෙහෙවින්ම බලපාන ක්ෂුද්‍රජීවී විශේෂය වන්නේ,

1. බැක්ටීරියා 2. දිලීර 3. වෛරස් 4. ඇල්ගී

7) අධි සුඛෝපභෝගී දැව වර්ගයක් නොවන්නේ,

1. යුකැලිප්ටස් 2. කළුවර 3. නැදුන් 4. තේක්ක

8) පහත ද්‍රව්‍ය අතරින් වර්තනාංකය වැඩිම ද්‍රව්‍යය කුමක්ද?

1. ජලය 2. වීදුරු 3. දියමන්ති 1. මැණික්

9) පහත සඳහන් පිළිතුරු අතරින් දැව වර්ගය හා එහි භාවිත අවස්ථාව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

1. පානක්කා - කුඩ මිට සෑදීමට 2. ලුණුමිදෙල්ල - ගෘහ භාණ්ඩ සෑදීමට

3. රුක්අත්තන - දොර ජනෙල් සෑදීමට 4. වල්ලපට්ටා - දිය යට කෙරෙන ඉදිකිරීම් සඳහා

10) වේගයෙන් වැඩෙන දැවමය ශාකයකි,

1. මහෝගනී 2. තේක්ක 3. යුකැලිප්ටස් 4. නැදුන්

## B කොටස - රචනා

1) (i). ස්වභාවික සම්පත් යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්නී (ල.2)

(ii). ස්වභාවික සම්පත්වල තිරසර භාවිතය යනු කුමක්ද? (ල.2)

(iii). වැවක් නිර්මාණය කිරීමෙන් මූලික වශයෙන් බලාපොරොත්තු වන අරමුණු 2 ක් සඳහන් කරන්න. (ල.4)

(iv). වියලි කලාපයේ කෘෂිකර්මාන්තයේදී ජලය අරපිරිමැසීම සඳහා භාවිතා කරන උපක්‍රමයක් සඳහන් කරන්න. (ල.2)

2) ශ්‍රී ලංකාව තුල ඛනිජ සම්පත්වල විශාල ව්‍යාප්තියක් පෙන්වයි.

(i). ඛනිජයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල.2)

(ii). ශ්‍රී ලංකාව තුල හමුවන ඛනිජ වර්ග 04 ක් නම් කරන්න. (ල.4)

(iii). පාෂාණයක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල.2)

(iv). පාෂාණ සඳහා නිදසුන් 02 ක් ලියන්න. (ල.2)

3) (i). ඛනිජ වල දැඩි බව සැසඳීම සඳහා සකස්කර ඇති පරිමාණය කුමක්ද? (ල.1)

(ii). ඔබ ඉහත දක්වූ පරිමාණයට අනුව දැඩිබවින් වැඩිම ඛනිජයත් දැඩි බවින් අඩුම ඛනිජයත් නම් කරන්න. (ල.2)

(iii). මැණික්වල දැඩිබව හේතුවෙන් ඒවා පහසුවෙන් ගෙවීයාමට ලක්නොවේ මැණික්වල මෙම ගුණය භාවිතයට ගන්නා අවස්ථාවක් සඳහන් කරන්නී (ල.1)

(iv). මැණික් කර්මාන්තය ආශ්‍රිතව ඇතිවී ඇති පාරිසරික ගැටළු 04 ක් සඳහන් කරන්න. (ල.4)

(v). මැණික් කර්මාන්තය ආශ්‍රිත ගැටළුවලට පිළියම් යෙදීමට පියවර ගන්නා ජාතික අධිකාරිය කුමක්ද? (ල.2)

4) මිනිස් භාවිතයේ ඇති පැරණිතම ඉදිකිරීම් ද්‍රව්‍යය "දැව" වේ.

(i). බව හා වැඩ කිරීමේ පහසුව නිසා් දැවය වෙස් මුහුණු කැපීමට යොදා ගනී. (ල.2)

(ii). දැව කඳන් කරත්තවල "බෝන් ලීය" සහ "වියගහ" සෑදීමට යොදා ගනී. (ල.1)

(iii). දිලීර වර්ධනයට බෙහෙවින්ම බලපාන සාධකය වන්නේයි. (ල.1)

(iv). දැව දිරාපත් වීම වැළක්වීමේ ක්‍රම 03 ක් සඳහන් කරන්න. (ල.3)

(v). රබර් හා පයින් දැව කල්තබා ගැනීම සඳහා ප්‍රතිකර්මය භාවිතා වේද (ලද1)

(vi). අධි සුඛෝපභෝගී දැව වර්ග 02 ක් නම් කරන්නද (ලද2)